# කේ. ජයතිලක සූරීන්ගේ සාහිත්‍යය නිර්මාණකරණය හා භාෂා භාවිතය

පූජ්‍ය බෝදාගම සුමන හිමි

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය සාහිත්‍යය ඉතිහාසයේ අද්විතීය සාහිත්‍යධරයෙකු ලෙස සැලකෙන කේ. ජයතිලක සූරීහු වර්ෂ 1926 ජුනි මස 27 වන දින කන්නිමහර ග්‍රාමයේ දී ජන්මලාභය ලැබූහ. එතුමා විසින් නවකතා දහඅටක් ද, කෙටිකතා සංග්‍රහ 8ක් ද, ළමාකෘති හා විචාර ග්‍රන්ථ කිහිපයක් ද රචනා කර ඇත. ඒ අතුරින් **පුනරුත්පත්තිය සහ තවත් කතා, එකගෙයි අවුරුද්ද, අතීරණය, කටු සහ මල්, පරාජිතයෝ, චරිත තුනක්, කාලෝ අයං තේ, රාජපක්ෂ වලව්ව, වජිර පබ්බතාදි** කෘති සුවිශේෂී වන්නේ, එම නිර්මාණ සහෘද පාඨකයන්ගේ සිත් දිනා ගැනීමට සමත් වූ නිසා ය. සරල, වියත් බස් වහරකින් ස්වකීය ලේඛනය නිර්මාණ ශරීරය අලංකෘත කරගත් කේ. ජයතිලකයන් හෙළ සාහිත්‍යයට සිදු කළ සේවාව සුවිශේෂී වේ. එම නිසා ම දෙවැනි මාර්ටින් වික්‍රමසිංහ යන අපර නාමයෙන් විරුද ලැබීමට ද හේ සමත් විය. මෙම ලිපියෙන් කේ. ජයතිලකයන්ගේ නිර්මාණ කෘති කිහිපයක් ඇසුරින්, එතුමාගේ සාහිත්‍යකරණය හා භාෂා භාවිතය පිළිබඳ විමසා බැලීමට අපේක්ෂිත ය.

ප්‍රමුඛ පද: **කේ. ජයතිලක, කොළඹ යුගය, නිර්මාණාත්මක බස්වහර, සිංහල සාහිත්‍යය.**

## කේ. ජයතිලක සූරීන්ගේ සාහිත්‍යකරණය සහ භාෂා භාවිතය

සාහිත්‍යය නිර්මාණකරුවෙකුට වස්තු බීජ, ප්‍රතිභාව හා නිර්මාණාත්මක බස් වහරක් තිබීම නිර්මාණයේ සාර්ථකත්වයට බෙහෙවින් ඉවහල් වන්නකි. එ මගින් සහෘද පාඨක මනසට සජීවී ව අමන්ත්‍රණය කළ හැකි ය. කේ. ජයතිලකයන් ද අපූර්ව සාහිත්‍යයධරයෙකු බවට පත් වූයේ, වියත්, ප්‍රබුද්ධ හා ගැමි ජීවන සුවඳ විහිදුවාලිය හැකි බස් වහරක් සිය ලේඛනයට උපයෝගී කර ගත් නිසා ය. ඔහු පවසන පවසන පරිදි, "අප කුඩා කල අපට යමක් කමක් කියා දීමට පඬිවරු නොවූහ. ආචාර්ය, මහාචාර්යවරු නොවූහ. ඒ සියල්ල ඉටු වූයේ අප විසින් කියවන ලද පොත්වලිනි. අප ඒවා කියවූයේ පිපාසයෙන් පෙළෙන්නන් ජලය සඳහා පෙන්වන අවශ්‍යතාවට

සමාන වූ ආධ්‍යාත්මික අවශ්‍යතාවයකිනි. ජල පිපාසිතයා කවර පානීය ජලයකින් වුව ද තෘප්තිමත් විය හැකි අතර, අපේ අධ්‍යාත්මයට අවශ්‍ය වූයේ එය පෝෂණය කරන පානයක් මෙනි." **(විශ්ව සාහිත්‍යය - අභ්‍යාසය හා නිර්මාණයඃ 1956, පි. 222)** සාහිත්‍යය සේවනයෙන් ම, සාහිත්‍යය සුපෝෂණය ලබා ගත් බව ප්‍රකාශ කර ඇත. රාජපක්ෂ වලව්ව නමැති නවකතාවේ සංඥාපනයෙහි "මගේ හැම නවකතාවක් ම පාහේ තේමා දෙකකවත් සංකලනයකි. මෙහි ද එබඳු තේමා දෙකක් වෙයි. එකක් ප්‍රකට ව පෙනෙන දේශපාලන තේමාව ය. අනික සැඟවී සිටින සමාජ තේමාව ය. මෙයින් වඩාත් බලවත් වනුයේ මෙසේ අදෘශ්‍යමානව සිටින තේමාව ය." **(රාජපක්ෂ වලව්ව, සංඥාපනය)** යන අදහස් දැක්වීමෙන්, කේ. ජයතිලකයන් සිය ලේඛනයේ අනන්‍යතාව හා විශේෂත්වය පැහැදිලි කර ඇත.

"ඒ දවස්වල පරණ දේවල් කඩා බිඳ දමලා අලුත් අලුත් දේවල් ගොඩ නඟන්න ඕනෑ කියලා උද්ඝෝෂණය කළේ අපිම තමයි. ඒ මේවා තාත්තලගේ ආධිපත්‍යය යටතේ තියෙන කාලෙ. එතකොට මොනව කිව්වත් දැන් යථාර්ථවාදිව තත්වයට මුහුණ දෙන කොට මේවා නැති භංග කරලා දාන්න අමාරුයි" **(රාජපක්ෂ වලව්වඃ 2005, පි. 21)** විශ්වවිද්‍යාලය අධ්‍යාපනයට පිවිසෙන තරුණයන්ගෙන් බොහෝමයක් නොයෙක් දේශපාලන ගොහොරු තුළ සිර ව, විප්ලවවාදීන් සෙයින් සම්ප්‍රදාය ඉක්මවා කටයුතු කිරීමට පෙලඹීම සුලභ සිද්ධියකි. නමුත් විශ්වවිද්‍යාලය අධ්‍යපනයෙන් පසු ව නැවතත් ගම්වදින ඔවුන් පුරාණ සමාජ තත්වයන්, චාරිත්‍රයන් ආරක්ෂා කිරීමට කටයුතු කරන අයුරු, කේ. ජයතිලකයන් රාජපක්ෂ වලව්වේ මහේන්ද්‍ර රාජපක්ෂ චරිතය මගින් මනාව නිරූපණය කර ඇත. පවතින දේශපාලන සූදුපිටියේ යථාර්ථය සියුම් ව උපහාසයට ලක් කිරීමට මොහු දක්වන්නේ සහජ දක්ෂතාවයකි.

නූතන දේශපාලන සන්දර්භයේ සියුම් අවකාශ, "සහෝදරයා, ලෝකෙ කොහෙවත් විප්ලවයක් ඇති වෙලා තියෙනවද කම්කරු පංතිය නැතිව? අන්න ඒ කම්කරු පන්තිය නැගිටල ඒවි නියම වෙලාවට" **(රාජපක්ෂ වලව්වඃ පි. 133)** සමාජ ක්‍රමයෙන් ම, සමාජ විප්ලවවාදයක් ගොඩනැංවීමට උත්සාහ කිරීමේ තථ්‍ය සංසිද්ධීන් මෙම නවකතාවේ දී ගැඹුරින් සාකච්ඡා කර ඇත. වලව්වාදය නිසා කුලහීනයැයි සම්මත මිනිසුන් විඳි පීඩාව යම් තරමකට හෝ සංසිඳුනේ ධනවාදය නිසා ය. ඉන් අනතුරු ව දේශපාලයේ දී සමාජවාදය ධනවාදයට එරෙහි ව යොදා ගත්ත ද, සමාජවාදීන්ට ද පොදු සමාජ අවශ්‍යතා පිළිබඳ නිවැරදි තක්සේරුවක් නො වී ය. එය පුහු ආටෝපයක් පමණක් ම විය. "මේ බෝතලේ ගල් වුණාට ඇතුළේ තියෙන්නේ විස්කි...... ගල් බෝතලේ දැක්කම කියන්නේ අනේ ඒ මහත්තයා ඇමැති වෙලත් ගහන්නේ ගල් කියලා. මිනිස්සු අපි බොනවට විරුද්ධ නෑ. විරුද්ධ උන්ට නැති දේවල් බොනවට. ගිය ආණ්ඩුවේ එවුන් සවුත්තු වුණේ විස්කි බෝතල්වල දාගෙන ගල් බීලා" **(රාජපක්ෂ වලව්වඃ පි. 136)** පාලකයන් මළ ගෙවල්, මඟුල් ගෙවල්, කොටහලු ගෙවල් අතනොහැර, සුදු පිරුවට ඇඳ, මල්වට්ටි ගෙන පන්සල් ගානේ ඇවිදින්නේ පාලිතයන් සතුටු කිරීමට ය. පාලිතයා සතුටු වන තරමට ඔවුන්ගේ පැවැත්ම ස්ථිර වේ. එම නිසා ගල් බෝතලේ විස්කි බීම ඔවුනට ප්‍රශ්නයක් නොමැත. බොරුවට

ජාතියට හෝ අගමට දක්වන සැලකිල්ල, මල් වට්ටි ගෙන පන්සල්වල යෑම හා සුදු පිරුවට දැරීම, ඒකා අපේ එකෙක් වීමට ප්‍රමාණවත් ය. "ගෑනිට බඩේ රුදාව හැඳුණත් දුවගෙන එන්නේ මන්ත්‍රීතුමා ළඟට. මගෙන් ලියුම් කෑල්ලක් ගත්තහම තමයි බබා එළියට වඩින්නේ.." **(රාජපක්ෂ වලව්වː පි. 140)** ජනතාව වන්දිභට්ටයන් ලෙස සිටින තාක්, දේශපාලඥයන්ට තම සූරාකෑම ලෙහෙසියෙන් සිදු කර ගත හැකි ය. එකී ජරාජීර්ණ තථ්‍ය දේශපාලන කතාව රාජපක්ෂ වලව්වෙන් මනාව ඉස්මතු කරන්නට කේ. ජයතිලකයන් සමත් වී ඇත. මෙහි බස් වහර සරල ය; කෙටි යෙදුම් ඇත; අවස්ථාවන් නො බිඳෙන පරිදි කතාව ගොනු කර තිබේ.

දහනම වන සියවසේ මැද භාගයේ මෙරට සිදු වූ දේශපාලනික වතාවරණය තම වස්තු බීජය කර ගත් කේ. ජයතිලයන්ගේ **දෙලොවට නැති අය** නමැති කෘතියෙන් මෙරට සංස්කෘතිය, සභ්‍යත්වය හා කුලවාදය කරපින්නාගත් දෙබිඩි මිනිසුන්ගේ ජීවිතාන්දරය පිළිබඳ කතා කරයි. මෙහි ජනතා පක්ෂයේ සූරියබණ්ඩාර, ජාතික පක්ෂයේ නායක ජයවික්‍රම, ධම්මදින්න, මාවෝ, දයාවංස, රුවිතන්ත, ගණේගොඩ, වීරසේකර, චන්ද්‍රා, සැලිනා ආදි චරිත මගින් නියෝජනය කර ඇත්තේ, එම යුගයේ ජීවත් වූ ඇතැම් මිනිසුන්ගේ ඉතිහාස කතාව යි. දෙලොවට නැති අය නවකතාවේ ජිනසිරිගේ (මාවෝ) මව වෘත්තියෙන් වෛශ්‍යාවක් වූවා ය. එම නිසා ඇයටත්, මාවෝටත් සමාජ අපවාදය නිතැතින් ම හිමි විය. "අම්මගෙ කැරැට්ටුව වහන්න පුතාගේ කලිසමෙන් පුළුවැන" යැයි **(දෙලොවට නැති අයː 2003, පි.10)** රචකයා එකී අපවාදය විස්තර කරන්නේ ජනවහරෙහි එන කියමනකිනි. ප්‍රභූ සමාජයට පහත්යැයි සම්මත කුලයකට හෝ රැකියාවක් කළ පවුලකට අයත් වූවෙක් තමන් පරයා ඉහළට යනු දැකීම ඇගේ කටු අනින්නාක් මෙන් වේදනාකාරී විය. මෙහි දී වීරසේකර මෙ රට ජනවිඥානයේ කුලය පිළිබඳ ඇති චිත්‍රය සූරියබණ්ඩාරට විස්තර කරන්නේ, "ඕකෙ අපට පෙනෙන්නේ ලස්සන සුදු පාට හුණු විතරයි. ටිකක් හාරලා බැලුවොත් බදාමත් කොන්ක්‍රීට් එකත් පෙනෙවි. තවත් හාරනකොට යකඩ දැල්. අන්න ඒ වගේ නොපෙනෙන බලවත් සංවිධානයක් තමයි කුලය" **(දෙලොවට නැති අයː 2003, පි. 109)** යනුවෙනි. එනම් කුලවාදය මිනිසුන්ගේ ලේ, මස්, ඇට, නහර දක්වා විහිදී ඇති බව ඉන් අදහස් කෙරේ. මෙ වැනි අවස්ථාවන් විස්තර කිරීමේ දී කේ. ජයතිලයන් පැරණි හා නූතන උපහැරණයන් යොදා ගෙන ඇති බවට නිදර්ශක මෙම කෘතියේ බොහෝ තැන්වල දැක ගත හැකි ය.

වෘත්තියෙන් පොත් වෙළෙන්දෙක් වූ ගණේගොඩගේ චරිතය දෙලොවට නැති අය නවකතාවේ සජීවී බව පවත්වාගැනීමට භාවිත කළ උපක්‍රමයක් වැනි ය. ගණේගොඩ තම වෙළඳාමෙන් ලැබූ ධනය තම ලේලිය වූ සිරිමාට දමා ගසමින් අසාමාන්‍ය සතුටක් ලැබූවෙකි. "ඔහු වැඩි වටිනාකමක් සහිත මුදල් නොට්ටු වෙන් කර මිටි බැඳගෙන ගොස් ඒ එක එකකින් සිරිමාට දමා ගසයි" **(දෙලොවට නැති අයː 2003, පි. 71)** වර්තමානයේ ද ධනවතුන්ගේ, දේශපාලකයන්ගේ පුතුන් නයිට් කලබ්වල ගොස් ලබන්නේ ද මෙ වැනි සතුටක් බව කියවන්නාගේ සිතට නො දැනෙන්නේ නම් පුදුමයකි. මෙහි යොදා ගත් වස්තු බීජය හා කතා රීතිය තව අවුරුදු ගණනකට වුව ද,

පාඨකයාට සජීවී බවක් ඇති කරමින් කියවීමට හැකි වීම රචකයාගේ නිර්මාණාත්මක දක්ෂතාවයකි. මීට අමතර ව "ස්වර්ණා මාවෝ තුළ කාලයක් තිස්සේ ගොජ දම දමා එක් වෙමින්" **(දෙලොවට නැති අයඃ 2003, පි. 198)** යන තැන මාවෝගේ චිත්ත ස්වභාවය ද, සුන්දරජීවගේ උන්මන්තකාගාරයේ ජීවත් වූ භෞතිකවාදී, විඥානවාදී, මාක්ස්වාදී පඬුවන් බමනමතින් සිදු කරන්නා වූ සංවාද ඉදිරිපත් කරන්නේ කෙටි වාක්‍ය මගිනි. "විශාල බුල්ඩෝසරයකින් මහා ගස් බිඳ හැළෙන පරිද්දෙන් ලීවිස්, පවුන්ඩ්, රිචඩ්, තොම්සන්, තාගෝර්, රාධක්‍රිෂ්ණන් ඇද හැළෙත්. ට්‍රොස්කි, මාවෝ සේතුං, ස්ටාලින්, ජොඩ්, හෙන්රි ජේම්ස් පාපන්දු මෙන් එහාට මෙහාට වීසි වෙති. වැටෙති. නැගී සිටිති. ඔබ මොබ වැනී යති. ඔවුන්ගේ සංවාදයේ දී ඉතිරි වන්නේ තොල්ස්තෝයි, දොස්තොයෙව්ස්කි, චෙකොෆ්, ජ්ලොබෙයර්, බල්සාක්, ගොගොල්, බ්‍රොන්ටේ ආදි හතර පස් දෙනෙකි." **(දෙලොවට නැති අයඃ 2003, පි. 213)** මෙහි ගොජ දම දමා, පාපන්දු මෙන් එහාට මෙහාට වීසි වෙති යන භාෂා යෙදුම් භාවිතයෙන් පාඨකයාගේ සිතේ චිත්තරූප මවා දැක්වීමට රචකයා සමත් වී ඇත.

චරිත තුනක් නවකතාව ඉසා, සනා හා රංජිත් සොහොයුරන් තිදෙනා වටා ගෙතුණෙකි. ඉසා පවුලේ වැඩිමලා ය; සනා ගෙදර දඩබ්බරා ය; රංජිත් ආත්මාර්ථකාමීයෙකි. චරිත තුනක් නවකතාවේ ඉසාගේ චරිතය ආත්මකථනයක ස්වරූපයෙන් ගලා යන්නකි. "එකට කෑවත් බොක්ක වෙනස්" යැයි ගැමියන් කියන්නේ නිකම්ම නො වන බව චරිත තුනක් නව කතාව කියවීමෙන් පසක් වේ. එතරම් ම ඔවුන්ගේ චරිත ස්වභාවයන් එකිනෙකාට වෙනස් ය. මෙහි "කෝකිලානේ සිටාණෝ" යැයි ගමේ මිනිසුන් අතර ප්‍රකට වූ ඉසා තම ජීවිතයම කැප කළේ පවුලේ දියුණුව පිණිස ය. විශේෂයෙන් ම පියාගේ අකල් මරණයෙන් පසු පවුලේ වගකීම කරපින්නා ගත් ඉසා එ මගින් ලැබුවේ අසීමිත තෘප්තියකි. විවාහයක් කර නොගත් හෙතෙම පසු කාලීන ව "කෝකිලානේ ඉසිවරයා" ලෙස විරුදාවලිය ලැබුවේ ඔහුගේ නිහඬ හැසිරීම නිසා ය. ගැමි පවුලක සැබෑ ජීවන රටාව වන්නේ ගොවිතැන යි. යල මහ කන්නේ කුඹුරට බහින ඔවුන්, අනිත් කාලවල දී හේන් ගොවිතැන් කරන්නේ බඩ වියත රැක ගැනීමට ය. අහේනි කාලයේ කොස්, කැලෑ අලවලින් කුස පුරවා ගැනීමට ඔවුනට සිදු වේ. "මොනවා කරන්නද මන්දා අටුවේ වී ටිකත් ඉවරයි වගෙ. අද තම්බන්ට වී ගන්න කොට හරියට මගෙ පපුව සූරන්නහෙ කුඩෙ නිකම් 'කරාස්' 'කරාස්' ගාලා අඩියේ හැපුණා" **(චරිත තුනක්ඃ 2007, පි. 33)** ඉසාගේ අම්මාට දැනුණ හැඟීම බොහෝ ගෙවල්වල අම්මාවරුන්ට අවුරුද්දේ එක් කාලයකට හෝ මුහුණදීමට සිදුවීම ඛේදවාචකයකි. මෙම සිද්ධිය පාඨකයාගේ ද සිතට ශෝකය දනවන අයුරින් ඉදිරිපත් කර තිබීම නිර්මාණයේ සුවිශේෂීත්වය ප්‍රකට කරයි.

ඉසාගේ තාත්තා පවුලේ දියුණුව වෙනුවෙන් වෙහෙස මහන්සි වී, රෑ දවල් නො තකා වෙහෙසෙන්නෙකි. තාත්තා අම්මාගෙන් දැඩි දෝෂාරෝපණයට ලක්වන්නේ බුරු ගසනා විට පමණි. එබඳු අවස්ථාවක, "සුදු කෙළියා හරි මොනවා කළා හරි අපට මෙන්න මේ දේ අඩුයි කියලා වචනයක් කියන්න මම ඉඩ තියලා තියෙනවදැ" යි **(චරිත තුනක්ඃ 2007, පි. 58)** අසමින් අම්මා නිහඬ කරවීමට ඔහු

සමත් වෙයි. මෙහි ඉසාගේ තාත්තාගේ චරිතය "තාත්තා තීරණයක් ගන්නේ යකඩයක් ගිලින්නාක් මෙනි. යකඩය ගිලින්නට මෙන් ම වමාරන්නටද අසීරු වන්නාක් මෙන් ඔහුට තීරණය ගැනීමට මෙන් ම වෙනස් කිරීමට ද අමාරුය." **(චරිත තුනක්: 2007, පි. 58)** මෙයින් ඔහුගේ තීරණවල දෘඪ ස්වභාවය උපමා භාවිතයෙන් දක්වා තිබේ. ඉපැරණි **සද්ධර්මරත්නාවලිය,** ජාතක පොත, **පූජාවලිය** වැනි ග්‍රන්ථ කර්තෘවරුන් ද පුද්ගල චරිත විස්තර කිරීමේ දී උපමා උපමේය භාවිත කර ඇත. තව ද "....ඒ වෙනුවට කියන්නේ 'වෙනදා වගෙ නෙමෙයි' කියායි. 'අභියෝග කරනවා' වෙනුවට 'ඕනෑ එහෙකුට කියනවා' කියායි. සන්ත්‍රාසයට පත්වීම 'බීරන්තට්ටු වීමය'.....මීට අමතර ව ව්‍යවහාරයට සමීප වනු පිණිස ලද ප්‍රයෝග ද මෙහි දක්නට ඇත. එදා දෙමවුපියන් දරුවන්ට යම් විධානයක් කෙළේ 'ගනින්, පලයන්, දිය, දීපිය' ආදි වශයෙනි......එපමණක් නො ව මවුපියන් උනුන් අතර කතාබහේ දී අන්‍යෝන්‍ය ගෞරවයක් ප්‍රදර්ශනය කෙරෙමින් 'ගනිල්ලකෝ, පලයල්ලකො, ඉඳිමුකො ආදි වශයෙන් බහුවචන රූපය ප්‍රයෝජනයට ගන්නා ලදි." **(සංඥාපනය, චරිත තුනක් නවකතාව)** මේ අනුව කේ. ජයතිලයන් ස්වකීය ලේඛනය අලංකාර කරනු වස් නොයෙක් භාෂා උපක්‍රම භාවිත කර ඇති බව පෙනේ. විශේෂයෙන් ම ජපානයේ දී චරිත තුනක් නවකතාවේ අත්පිටපත කියවූ එදිරවීර සරච්චන්ද්‍රයන් "...එය මා තුළ කොතරම් ප්‍රමෝදයක් ඇති කළේ ද යතහොත් මා තුළ ජපානයට තිබූ ආකර්ෂණය යටපත් වී ගොස් ආපසු ශ්‍රී ලංකාවට පැමිණීමේ ආශාව දැල්විණි." **(එදිරවීර සරච්චන්ද්‍ර විසින් ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලද චරිත තුනක් නවකතාවේ ප්‍රස්තාවනාව)** යැයි පළ කළ අදහස, මෙම කෘතියේ විශිෂ්ටත්වය මොනවට පැහැදිලි කරයි.

**"පරාජිතයෝ"** නවකතාවේ උදේනි වෘත්තීය, ආර්ථික, විවාහ හා සමාජීය වශයෙන් සාර්ථක වන්නට උත්සාහ දරන්නෙකි. මෙයින් දහනම වන සියවසේ දේශපාලන හා සමාජ යථාර්ථය සියුම් ව ඉස්මතු කරන්නට උත්සාහ ගෙන ඇති බව පෙනේ. මුල් අවධියේ උදේනිට දේශපාලනය පිළිබඳ එතරම් උනන්දුවක් නොවී ය. ඒ බැවි, "දේශපාලනේ කියන්නේ දිවට තොලට අභ්‍යාසයක් විතරයි. මට ඕවා ගැන වැඩි කැමැත්තක් නැති බව අයිසෙ දන්නවා නොවැයි" **(පරාජිතයෝ: 2007, පි. 18)** උදේනි අසෝකට දේශපාලනයට මුබරිකම පමණක් හොඳට ම ප්‍රමාණවත්යැයි පවසන්නේ සියුම් අතුල් පහරක් ද එල්ල කරමිනි. කෙසේ නමුත් අසෝකගේ දැඩි බලපෑම නිසා ම දේශපාලනයේ අයනු ආයනු කියවීමට උදේනිට සිදු වූ අතර, පසු ව දේශපාලනයේ ආකස්මික තත්වයක් ද බලාපොරොත්තු වූ බව පෙනේ. පසු කලෙක උදේනි චාලනි විවාහ කරගත්තේ ගෙදරටත් නො දන්වා ය. නමුත් ඔවුන් දෙදෙනා බලාපොරොත්තු වූ සුන්දර, ආදරණීය විවාහ ජීවිතය කෙටි කලකින් ම බිඳ වැටුණි. එ මඟින් චාලිනි දැඩි මානසික අවපාතයකට ලක් වන බව **පරාජිතයෝ** නවකතාව කියවීමෙන් පැහැදිලි වේ. දිනක් ගෙදර වැඩට සිටි පියදාස හොරෙන් බැලුමයක් පිම්බීමට උත්සාහ කිරීමේ දී එය හඬ නගා පුපුරා ගියේ ය. මේ දෙස බලා සිටි චාලිනි බලාපොරොත්තුවලින් පිම්බුණු තම ජීවිතයත් පුපුරා ගියේ මෙලෙසින් නො වේදැයි කල්පනා කරන්නට විය. "බැලුනයට වූ දෙය ඇගේ සිතට තදින් කා වැදිණි. ඇයට පෙනුණේ එය තමාට කරන ලද සරදමක් ලෙස ය. තමා තුළ තිබූ බලාපොරොත්තු සියල්ලත් සිඳී ගියේ

මේ බැලුනය පුපුරා ගිය ආකාරයෙන්ම නොවේදැයි ඈ ඇගෙන්ම ප්‍රශ්න කළාය" **(පරාජිතයෝ: 2007, පි. 181)** අවසානයේ මෙම පශ්චාත්තාපය ඇගේ මරණයට ද හේතුවන්නට ඇත. කේ. ජයතිලකයන් උත්තම පුරුෂ අඛ්‍යාන ශෛලියෙන් රචිත පරාජිතයෝ නවකතාව තුළ සිද්ධි, අවස්ථාවන් හා පුද්ගල සන්තානයන්ගේ ක්‍රියාකාරීත්වය සංකේතාත්මක ව රචනා කර ඇති බවට ඉහත උදාහරණය සාක්‍ෂ්‍යය වේ. එය පාඨකයාගේ කියවීම් රුචිය වර්ධනය අභිවර්ධනය කිරීමට හේතු වේ.

ජයතිලයන්ගේ නිර්මාණකරණය නවකතාවට පමණක් සීමා නො වී ය. හෙතෙම කෙටිකතා කරුවෙකු, සාහිත්‍ය විචාරකයෙකු, නාට්‍ය පිටපත් කරුවෙකු හා ළමා පොත් රචකයෙකු ලෙස ද පාඨකයාගේ සිත් දිනා ගත්තෙකි. "කේ. ජයතිලකගේ කෙටිකතා සංග්‍රහයක් කියවන පාඨකයා ගමක් මැද පිහිටි උද්‍යානයක සිට පොතකට ඇස් යොමා සිටින තැනැත්තෙකුට සමාන කළ හැකි ය. මුළු කාලය පුරාම ඔහු සිටින්නේ ගැමි පරිසරය මැදය. ඔහු එහි ඇති ගස්කොළන් පමණක් නො ව සතා සිව්පාවුනුත්, ගැහැනු මිනිසුනුත්, ඔවුන් එකට වෙළී පැටලී කරන ජීවන සටනත් හඟියි; දකියි." **(වජිර පබ්බත, පසුපිට)** ඉහත සටහනින් ජයතිකයන්ගේ කෙටිකතා සංග්‍රහයක් කියවන තැනැත්තා, එහි ම ජීවත්වන චරිතයක් බවට පත් වන්නේ නිතැතෙනි. එතරම්ම ඔහුගේ නිර්මාණකරණය සජීවී ය; තාත්වික ය.

කළුඅච්චිගමගේ ජයතිලකයන් සාහිත්‍යය ලෝකයට දායාද කරන ලද කෙටිකතා සංග්‍රහ ගණන අට (08) කි. ඒ අතුරින් **වජිර පබ්බත** හා **අතීරණය** යන කෘති මෙහි ලා විමසුමට බඳුන් කෙරේ. අතීතයේ ගම්බද වතුවල කුලීවැඩක් කිරීම ඉතා පහත් රක්‍ෂාවක් ලෙස සැලකිනි. වංශවත් පවුලකට අයත් වූවෙක් වන පොඩි මහත්තයා ආර්ථික අඟහිඟකම් නිසා වත්තේ වැඩට යාම, වජ්‍ර පර්වතයක් සේ වතුපිටිවල කුලීවැඩ කිරීම පහත් රක්‍ෂාවක්යැයි පැවැති සම්ප්‍රදාය බිඳ දමන්නකි. පොඩි මහත්තයා වත්තේ වැඩට යෑම ගමේ මිනිසුන්ට හොඳ ප්‍රවෘත්තියක් විය. මිනිසුන්ගේ නොයෙක් කතා නිසා පොඩි මහත්තයා කොතරම් කෝපයෙන් සිටියේ ද යත්, පෑනේ තීන්ත ස්වල්පයක් බිම වැට්ටවීමේ වරදට යසාට කබුල් පහර කිහිපයක් කෑමට ද සිදු විය. "තොපි ඉස්කෝලෙ ගිහින් විභාග පාස් කරලා හම්බ කරන කොට අපේ සොහොන්වල ගසුත් පැළ වේවි. අඩිය තියන්නේ නෑ මීට පස්සේ ඉස්කෝලෙ හරියට" **(වජිර පබ්බත, 2005, පි. 31)** මෙම ප්‍රකාශයෙන් ජනිත කරන අදහස ඉතා ගැඹුරු ය. දරුවා පාසලට යැවිය යුතු ය. නමුත් අධ්‍යාපනය සඳහා පිරිවැය දැරීමේ හැකියාවක් දෙමාපියන්ට නොමැත. ඒ වෙනුවෙන් නැවතත් කුලී වැඩට යාමට ශක්තියක් උපදවා ගැනීමට පොඩි මහත්තයාට නො හැකි වූ අතර, යසාගේ ඉස්කෝලෙ ගමනත් ඉන් අභවර විය. ආර්ථික අපහසුතා නිසා අධ්‍යාපනය කඩාකප්පල් කරගත් දරුවන් බොහෝ ප්‍රමාණයක් අද වුව ද දැක ගත හැකි ය. මෙම කෙටි කතාවෙන් එම සමාජ ප්‍රශ්නයේ අඳුරු පැතිකඩ සාකච්ඡාවට බඳුන් කර ඇත්තේ පුළුල් දෘෂ්ටි කෝණයකිනි.

අතීතකාමයෙන් ඔද වැටුණු තැනැත්තාට තමා පාසල් ගිය කාලය, තමාගේ ළමා කාලය තරම් පාසල, ගම දැන් හොඳ නැත. ඒවා පරිහානියට ගොස් ඇතැයි සිතෙන වාර අනන්ත ය. ඉස්කෝල වත්ත කෙටිකතාවෙන් තම සුන්දර පාසල් කාලය

සිහිපත් කරන්නෙකුගේ කතා පුවතක් ඉදිරිපත් කෙරේ. එහි දී පාසලේ මල් වැටවල් දෙක එදා හොඳට නඩත්තු වූ බවක් "එතැන් සිට පාසැලේ මිදුල දක්වා යන ප්‍රධාන මග දෙපස සිහින් කොළ සහිත මල් ගස් වැට දෙකක් වවා තිබිණි. එදා එය උතුරු මිනිස් සිතේ කෙලෙසුන් වැඩිය නොදී භාවිතයට සිඳ ලන්නාක් මෙන් නිතර නිතර කප්පාදු කිරීමෙන් එක් මට්ටමක තබනු ලැබීය." **(වජිර පබ්බත, ඉස්කෝල වත්තඃ පි. 45)** උද්ධෘතයේ උතුරු මිනිස් සිතේ කෙලෙසුන් වැඩිය නොදී භාවිතයට සිඳ ලන්නාක් මෙන් යන උපමාවෙන් පාසල් මිදුල දක්වා වවා තිබූ මල් වැටවල් දෙක නිසිකල නඩත්තු කළ බව දැක්වීමට යොදා ගෙන ඇත. මේ ඇවිද යන මොහොත වන විට භෞතික ව පාසල දියුණු වී ඇතත්, දරුවන්ගේ හැසිරීම්වල හා බාහිර පරිසරයේ තත්වය දකින විට කතානායකයාට පශ්චාත්තාපයක් ඇතිවීම පුදුමයක් නො වේ. මෙහි එන එක් සඳහනක් මෙහි ලා වැදගත් වේ. "එය දිනමිණ පත්‍රයක මුල් පිටුවේ කැබල්ලක් විය. මහාජනයා පාර්ලිමෙන්තුව ආක්‍රමණය කර කථානායකගේත් මැති ඇමතිවරුන්ගේත් ආසනවල වාඩිගත් අවස්ථාවේ පින්තූරයක් එහි එක් පැත්තක විය." **(වජිර පබ්බත, ඉස්කෝල වත්තඃ පි. 48)** අධ්‍යාපනය දරුවන්ගේ මොළ පිරිසිදු කිරීමට යොදා ගත යුත්තකි. එසේ නො වන්නේනම් අනාගතයේ මජර දේශපාලකයන් බිහිවීම වැළැක්විය නො හැකි ය. නමුත් එකී මජර දේශපාලකයන්ගේ දූෂිත ක්‍රියාවන්ට එරෙහි ව ජනතා ව ක්‍රියාකරන අයුරක් පෙනෙන්ට නැතිමුත්, නොයෙක්වර එම දූෂිත මැති ඇමතිවරුන් ම කථානයක පුටුව ආක්‍රමණය කර වාඩි වී සිටින අයුරු පමණක් පුවත්පත්වල පළවීම කේතරම් ශෝචනීයදැයි ඉස්කෝල වත්ත කියවන විට මාහට දැනුණු හැඟීම යි.

විද්‍යාභූෂණ විශ්වවිද්‍යාලයක මහාචාර්යවරයෙකි; එමෙන් ම ප්‍රසිද්ධ නවකතාකරුවෙකි. දිනක් "ඔහු චිත්‍රපටය බැලීමට ගියේ දියත්තක් සේ පිරිසිදු සැහැල්ලු මනසක් ඇතිවය." **(අතීරණය, ගුරුවරයා, ශිෂ්‍යාව සහ ගැහැනිය, 2004, පි. 07)** චිත්‍රපටය නරඹා අවසන් වෙත්ම දියකඩිත්තක් සේ පිරිසිදුව තිබූ ඔහුගේ මනස, මඩකඩිත්තක් සේ වික්ෂිප්ත විය. එහි දී ඔහුට හමුවන වජිරානි පොතක් සොයා ගෙදරට ඒමට තරම් හිතවත් වූවා ය. පොත සේවීමට විද්‍යාවිභූෂණත් සමග කාමරයට පැමිණි වජිරානි, "අපෝ! අනේ කාමරේ හැටි! කිසිම පිළිවෙළක් නෑ. මම මේක අස්කරලා තියලා යන්නම්." යැයි පැවසූ විට, "ඕනැ නෑ. ඔහේ තිබුණාවේ! හැමදාම ඕවා ඔහොම තමයි. හරියට අපේ ජීවිත වගේමයි." **(අතීරණය, ගුරුවරයා, ශිෂ්‍යාව සහ ගැහැනිය, 2004, පි. 07)** විද්‍යාවිභූෂණ පවසන්නේ වෙනත් අරමුණක් ද සිතේ තබාගෙනයැයි කියවන්නාට සිතීම අරුමයක් නො වේ. සාහිත්‍යය නිර්මාණය ශෘංගාරය, උපසහාසය සෘජු ව ම නොකියා ඉදිරිපත් කිරීමට නිර්මාණකරුවා දක්ෂ විය යුතු ය. සාහිත්‍යයේ මෙන් ම බමුණු දහමේ ද "ගැහැනු කවුරු ද වරදේ නො බැඳෙන" යනාදි කියමන් මගින් ගැහැනුන් චපල, කාමාසක්ත තැනැත්තියන් ලෙස නිර්දය විවේචනයට ලක් කර ඇත. නමුත් ගැහැනියකගේ භාවමය හැඟීම් පිළිබඳ ඔවුන් සානුකම්පිත වූ බවක් නො පෙනේ. ගැහැනු පිරිමි භේදයකින් තොර ව පිරිසිදු දියත්තක්, දිය පිරුණු මඩවලක් වීමට ඕනෑ තරම් හේතු ගුරුවරයා, ශිෂ්‍යයා සහ කාන්තාව කෙටිකතාවෙන් ඉස්මතු කිරීමට කේ. ජයතිලකයන් සමත් වී ඇති බව පෙනේ.

## සාකච්ඡාව සහ සමාලෝචනය

සාහිත්‍යය නිර්මාණකරුවා භාෂාව මැටි ගොඩක් සේ ගෙන, කුඹලා තම අභිරුචිය අනුව මැටිවලින් නානාවිධ මැටි මෙවලම් සාදන්නාක් මෙන්, නිර්මාණකරුවා ද භාෂා ප්‍රයෝග භාවිත කරමින් උසස් නිර්මාණ ඉදිරිපත් කළ යුතු ය. එයින් සාහිත්‍යයේ ප්‍රගමනයත්, පාඨකයන්ගේ සාහිත්‍යය රසාස්වාදයත් වැඩි දියුණු වේ. මෙහි දී කේ. ජයතිලක සාහිත්‍යධරයාගේ නිර්මාණ කිහිපයක් සාකච්ඡාවට බඳුන් කර ඇති අතර, රදාවාන හා කන්නිමහර ආශ්‍රිත කරගනිමින් බොහෝ නිර්මාණ රචනා කර තිබීම සුවිශේෂී කරුණකි. සාහිත්‍යය, දේශපාලනය, මාක්ස්වාදය හා බුදු දහම පිළිබඳ මනා දැනුමක් ජයතිලකයන් සතු ව පැවැති බවට ඔහුගේ නිර්මාණ සාක්ෂ්‍යය දරයි. කුඩා පෙදෙසක, සීමිත චරිත කිහිපයක් යොදාගෙන, කතාව එක දිගට නො බිඳෙන අයුරින් රසවත් ව ගොනු කිරීමට තරම් දක්ෂතාවක් ඔහු සතු වූ අතර ම, යෝදාගත් වස්තු බීජවල වටිනාකම ද අකාලික ය. එනම් ඔහුගේ නිර්මාණ එදාට වඩා අදටත්, අදට වඩා අනාගතයටත් සජීවී ව ගළපා ගත හැකි ය. එසේ ම කේ. ජයතිලකයන්ගේ නිර්මාණවල දැකිය හැකි පොදු ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ.

- උපමා උපමේය
- සංකේතාත්මක හැඟවීම්
- කෙටි වාක්‍ය ඛණ්ඩ
- ජන වහරෙහි එන ආමන්ත්‍රණ
- සරල බස් වහර
- සජීවී ආමන්ත්‍රණ

කේ. ජයතිලක සූරීන් විසින් තමාගේ නිර්මාණවල සිද්ධි, පුද්ගල චරිත ස්වභාවයන් විස්තර කිරීම සඳහා ජනවහරෙහි එන උපමා උපමේයන් බොහෝ තැන්වල යොදා ගෙන ඇත. ඇතැම් උපමා උපමේයන් ඔහුගේ ම නව ඉදිරිපත් කිරීම් ය. තව ද ශෘංගාරය, කෝපය, කුතුහලය, ඊර්ෂ්‍යාව වැනි භාවාත්මක හැඟීම් දැක්වීමේ දී සංකේතාත්මක ඉදිරිපත් කිරීම, කෙටි වාක්‍ය ඛණ්ඩ භාවිතයෙන් අදහස් තීව්‍ර කිරීම, ගැමි ජන වහරෙහි එන කමත් බස, ප්‍රදේශීය ආමන්ත්‍රණ හා සරල භාෂා හැසිරවීම මනාව යොදාගැනීමට හේ සමත් විය. ඔහුගේ සෑම නිර්මාණයක් ම වැඩි වාර ගණනක් මුද්‍රණය කර තිබීමෙන්, පාඨකයා මහත් අභිරුචියකින් එම කෘති වැළඳ ගත් බව පෙනේ. ලාංකේය සාහිත්‍යය වංශකතාවේ නො මැකෙන ශ්‍රේෂ්ඨ ගත්කතුවරයෙකු ලෙස කේ. ජයතිලකයන් හැඳින්වීම අතිශෝක්තියක් නො වන බව පැහැදිලි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරසිංහ, සේපාල් (2009) **නූතන කෙටිකතා විචාරය**, සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන, නුගේගොඩ.

කුමාරසිංහ, කුලතිලක (2005) **අද්‍යතන සිංහල නවකතා**, ගොඩගේ, කොළඹ.

ජයතිලක, කේ (2004), **අතීරණය**, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12

ජයතිලක, කේ (2005), **චරිත තුනක්**, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12

ජයතිලක, කේ (2003), **දෙලොවට නැති අය**, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12

ජයතිලක, කේ (2007), **පරාජිතයෝ**, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12

ජයතිලක, කේ (2005), **රාජපක්ෂ වලව්ව**, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12

ජයතිලක, කේ. (2005), **වජිර පබ්බත**, ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12